# සුවෙන් පෙරට
# e ඉගෙනුම් පියස
# මිනුවන්ගොඩ

- ශ්‍රේණිය - 6
- විෂයය - ඉතිහාසය
- පාඩම - 05 - අපේ අතීත රජවරු


- සැකසුම - තමාලි පෙරේරා
  නියෝජ්‍ය විදුහල්පති
  මිනු/ බලබෝව කණිෂ්ඨ විද්‍යාලය



දුටුගැමුණු රජතුමා

# දුටුගැමුණු රජුගේ,

- ❖ මව -විහාර මහා දේවිය
- ❖ පියා -කාවන්තිස්ස රජතුමා
- ❖ සොහොයුරා _තිස්ස කුමරු




- මේ රජ පවුල ජීවත් වූයේ මාගම රාජධානියේය
- පැරණි මාගම රාජධානියට අයත්ව තිබුණේ ලංකාවේ දකුණු හා ගිනිකොණ ප්‍රදේශයන්ය
- අතීතයේ ඒ ප්‍රදේශය හැඳින්වූයේ රුහුණු රට යන නමිනි



# එළාර රජතුමා

- මෙකල අනුරාධපුරය පාලනය කළේය
- දකුණු ඉන්දියාවේ සොලී දේශයේ සිට මෙරටට පැමිණි අයෙකි.
- මාතොට වරායේ ආදායම ලබා ගත්තේය
- නීතිගරුක ධාර්මික පාලකයෙකි



# කාවන්තිස්ස රජතුමා

- දස මහා යෝධයන්ගෙන් යුත් සේනාව සකස් කළේය.
- වගා කටයුතු සිදු කිරීමට තිස්ස කුමරු දිගාමඩුල්ලට යැවීය .
- එළාර පරාජය කිරීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කළේය .



# දස මහා යෝධයෝ



වේළුසුමන


නන්දිමිත්‍ර


ඵුස්සදේව


සුරනිමල


ථේරපුත්තාභය


ඛංජදේව



ලභියවසභ


මහාසෝණ


මහාභරණ


ගෝඨයිම්බර

- දුටුගැමුණු රජතුමා එළාර රජු පරාජය කර ජය ලබා ගත්තේය
- එහිදී රජුට සහයෝගය ලබා දුන්නේ දස මහා යෝධයින් සහ කණ්ඩුල ඇත් රාජයාය



# දුටුගැමුණු රජුගේ ආගමික නිර්මාණ

රුවන්වැලිසෑය



මිරිසවැටිය



ලෝවාමහාපාය



# දුටුගැමුණු රජුගේ චරිතයේ කැපී පෙනෙන ලක්ෂණ

- සැලසුම්සහගත බව
- ධෛර්යවන්ත බව
- අභියෝග ජයගැනීම
- රටට ආගමට හිතවත් වීම
- ගරු කළ යුත්තන්ට ගරු කිරීම
- රටවැසියන්ට ආදරය කිරීම



## ❑ ක්‍රියාකාරකම

1.දුටුගැමුණු රජුගේ මව ,පියා සහ සොහොයුරා නම් කරන්න
2.මෙම රජ පවුල ජීවත් වූයේ කුමන රාජධානියේද?
3.මෙකල අනුරාධපුරය පාලනය කළ සොළී රජතුමා කවුරුන්ද ?
4.එළාර රජු ආදායම් ලබාගත් අනුරාධපුරයට බටහිරින් වූ මුහුදු වෙරළේ පිහිටි වරාය කුමක්ද ?
5.එළාර රජු ධාර්මික හා නීතිගරුක පාලකයෙකු බවට මහාවංශයේ දැක්වෙන සාක්ෂියක් ලියා දක්වන්න
6.කාවන්තිස්ස රජතුමා විසින් තිස්ස කුමරුන්ව වගා කටයුතු සඳහා පිටත් කර හැරියේ කුමන ප්‍රදේශයටද ?
7.එම ප්‍රදේශය වර්තමානයේ හඳුන්වන නම කුමක්ද ?
8. එළාර රජු පරාජය කිරීමට දුටුගැමුණු රජුට සහාය වූ දසමහා යෝධයන් නම් කරන්න .
9.එම යුද්ධයේ දී රජුට උදවු කළ ඇත් රාජයා නම් කරන්න.
10.එළාර රජුගේ රාජ්‍ය කාලය ලියා දක්වන්න .
11. දුටුගැමුණු රජතුමා අනුරාධපුරයේ ඉදි කළ වෙහෙර විහාර තුනක් නම් කරන්න
12. රුවන්වැලිසෑයේ වැඩ කටයුතු අවසන් කරන ලද්දේ කවුරුන්ද?
13.දුටුගැමුණු රජුගේ නියම නම කුමක්ද ?
14. එළාර රජුගේ දේහය ආදාහනය කිරීමෙන් පසු දුටුගැමුණු රජතුමා රටවැසියන්ට පැණවූ අණ කුමක්ද ?
15.දුටුගැමුණු රජුගේ චරිතයේ කැපී පෙනෙන ලක්ෂණ පහක් ලියන්න .

ස්තූතියි !

තමාලි පෙරේරා